ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 ඔක්තෝබර් 01 සඳු
04 වෙළුම - 49 කල
සතිපතා පත්‍රය - පිටු
මිල රු 10.0

# ළමා ප්‍රදීපය





# ලෝක ළමා දිනය අදයි !

ළමා ප්‍රදීපය
ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# "ලෝක ළමා දිනය" තවත් එක් දිනයක් පමණක්ද?

## ආදරණීය දුවේ පුතේ...

අද ඔක්තෝබර් පළමු වනදයි. අද දිනය ලොවපුරා ළමුන්ට සුවිශේෂිවූ දිනයකි. ජාත්‍යන්තර ළමා දිනය අදට යෙදී ඇත. ඉතිහාසයට අනුව ළමයින්ගේ අයිතීන් පිළිබඳව ප්‍රථම ප්‍රකාශය නිකුත් වී ඇත්තේ 1924 දීය. 1959 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ළමා අයිතිවාසිකම් ප්‍රකාශනයක් නිකුත් කළ අතර එහිදි මානව සංහතිය විසින් ළමයාට නිසි තැන දීමට බැඳී සිටින බව කියැවුණි. මෙම ලේඛනවල කරුණු ක්‍රියාත්මකවූයේ අල්ප වශයෙනි.

1979 වසරේදී ලෝක ළමා වර්ෂය ප්‍රකාශයට පත් කළ අතර 1989 දී එක්සත් ජාතින්ගේ සංවිධානය විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සම්මත කර ගැනිනි. 1992 වර්ෂයේදී අප රටේද මෙය සම්මත කර ගැනුනු අතර ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ ළමයින් සම්බන්ධයෙන් පිළිගෙන ඇති, අයිතිවාසිකම් ගණනාවකි.

මෙම ප්‍රඥප්තියෙහි සඳහන් වන ළමා අපේ අයිතිවාසිකම් පිළිබඳව (ළමයා පිළිබඳ නිර්වචනය) මෙසේ සඳහන් වේ. ''අවුරුදු 18 ට **පහළ සැම කෙනෙකුම ළමයකු ලෙස සැලකේ. ඔවුන් හට මෙම ප්‍රඥප්තියේ සඳහන් සියලුම අයිතිවාසිකම් හිමි විය යුතුය.''**

අද ළමා පරපුර ඉතා ශෝචනීය ඉරණමකට ගොදුරු වී ඇත. ප්‍රඥප්තියෙහි සඳහන් ළමුන්ගේ අයිතිවාසිකම් අද වචන වලට පමණක් සීමා වී ඇත. දිනපතා අපට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්ගෙන් අහන්න දකින්න ලැබෙන සිදුවීම් වලින් කියාපානුයේ ළමා ලොවේ අසරණබවයි. මෑත භාගයේදී ළමා අපචාරයන්, ළමුන් දූෂණය කිරීම, බහුල වශයෙන් සිදුවූ අතර ළමා ශ්‍රමිකයින් හා ගබ්සාවන් කර ගන්නා ළමුන් ගේද වර්ධනයක් දක්නට ලැබෙයි.

අද අපරට කාමාතුරයන්ගේ රජදහනක් බවට පත්ව ඇත. ළමා හා කාන්තා කාර්යාශය මේ පිළිබඳව වාර්තා කරන්නේ මේ පරිද්දෙනි. මෙම සංඛ්‍යාවෙන් වැඩිපුර සංඛ්‍යාවක් මීට ගොදුරු වුයේ ළමුන්ය.

| ස්ත්‍රී දූෂණ | |
|---|---|
| වර්ෂය | ප්‍රමාණය |
| 2010 | 235 |
| 2011 | 281 |

| බරපතළ ලිංගික අපයෝජන | |
|---|---|
| වර්ෂය | ප්‍රමාණය |
| 2010 | 21 |
| 2011 | 28 |

අප මේ කරුණු හෙළි කළේ ළමා ඔබට මේ පිළිබඳව දැනුවත් භාවයක් ලබා දියයුතු නිසාවෙනි.

ළමයින්ගේ හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ඔවුන්ට හිතකරවූ සංවේදී සමාජයක් ගොඩනැංවීම ළමා සංවර්ධනය හා කාන්තා කටයුතු අමාත්‍යාංශයට පැවරී ඇති සුවිශේෂී වූ වගකීමකි. මෙම අමාත්‍යාංශය යටතේ ළමා ලේකම් කාර්යාලය, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය හා ජාතික කාන්තා කමිටුව යන ආයතනයන් ඇතුළත්ය. මේ සියලු ආයතනයන් හි විවිධ වූ අරමුණු මුල් කොට ගනිමින් සමාජය තුළ සුවිශේෂී වූ කාර්යය භාරයක් ඉටු කරනා බැව් සැබෑය.

ළමා අපයෝජන පිටු දැකීමෙහිලා කටයුතු කරන යාන්ත්‍රණය ජාතික ළමා ආරක්ෂණ අධිකාරියයි. මොවුන්ට මෙම වසරේ මුල් කාර්තුව තුළ ළමා අපයෝජනයන් 1361 වාර්තා වූ බැව් සඳහන් විය. නමුත් මේවාට සම්බන්ධ වැරදි කරුවන් නීතියේ රැහැනට අසු කර ගන්නට (විශේෂ පොලිස් විමර්ශණ ඒකකය මගින් පරික්ෂණ කර) මොවුනට හැකි වුණිද?

ආදර දුවේ පුතේ ඔබත් මාධ්‍යයට හා නූතන තාක්ෂනය භාවිතයට නැඹුරු වෙලා ඉන්නවා. අද මේ නූතන මාධ්‍ය ඔබට අහිතකර ලෙස බලපාන තවත් අවස්ථාවක් හැටියට දැන්වීම් ප්‍රචාරය ගෙන හැර දක්වන්නට පුළුවන්. විශේෂයෙන්ම රූපවාහිනී දැන්වීම් විසින් ඔබේ විශ්වය වැඩිහිටියාගේ විශ්වයට සමාන ලෙස පුළුල් කර තිබෙනවා. ඔබ අහිංසක නිසා දැන්වීම් මගින් මිථ්‍යාව හා සංවේදිතා ඔබ වෙත ප්‍රදානය කරනවා. විවිධ වයස් මට්ටම් අනුව ළමා කාලයේදී මේ දැන්වීම් ඔබව අනපේක්ෂිත ලෙස ඩැහැ ගන්නවා. මේ රූපවාහිනි දැන්වීම් නිසා වැඩිහිටියකු සේ පරිභෝජන තේරීමකට ඔබව හුරු කරන්නට සමාජය නිර්මාණය වෙනවා. ඒ වගේම දුම්පානය, මත් ද්‍රව්‍ය පානය වැනි අනිසි දෑ වලටත් මේ දැන්වීම් ඔබව පොළඹවන්නට පුළුවනි. හොඳ හා නරක හරි සහ වැරැද්ද අතර වෙනස හොඳට වටහාගෙන ළමා කාලය විවෘත මනසින් ඔබ භාර ගන්නවා නම් කිසිම රුදුරු බලවේගයකට ඔබව ගොදුරු කර ගන්නට බැහැ. ඉතින් ඔබේ දවසේදී මේ සියල්ල අවබෝධ කරගෙන ඔබේ ලෝකය ගොඩ නගන්නට දේවාසිරි පතා ඔබ වෙනුවෙන් අපිද යාච්ඤා කරන බව සිහිපත් කරන්න.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

**කුමර නයනජිත්**
ළමා ප්‍රදීපය, සහය සංස්කාරක



# සිරිලක කිතුනු ඉතිහාසය

අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසිනි

කිතු දහම ලංකාවට හඳුන්වා දෙන ලද්දේ පෘතුගීසීන් විසින් යැයි කියන්නෝ වෙති. මේ අනුව කිතු දහම දිවයිනේ පතළ වුයේ ක්‍රි.ව. 1505 න් පසුව බව ද මේ පිරිස පවසති. එහෙත් සත්‍යය එය නොවේ.

කිතු දහම සංවිධානාත්මකව ප්‍රචාරය කරනු ලැබුවේ පෘතුගීසීන් දිවයිනට පා තැබූ පසු බව සත්‍යයක් වුවත් ඉන් බොහෝ කලකට පෙර මෙහි කතෝලික කිතුනු පිරිස් සිටි බව සත්‍යයකි. විශාල වශයෙන් මේ පිරිස ව්‍යාප්ත වී සිටියේ ද යන කරුණ තවදුරටත් පර්යේෂණ මගින් සොයා ගත යුතුව ඇත. එහෙත් මෙතෙක් ලැබී ඇති සාධකවලින් ඉතා ස්වල්පයක් මෙසේ ය.

පෘතුගීසීන්ගේ පැමිණීමට පෙර දකුණු ඉන්දියාවේ 80,000 ඉක්මවා කිතුනු පිරිසක් ජීවත්ව සිටි බව වාර්තා වන්නේ ය. මේ සම්බන්ධයෙන් දත්ත රැසක් ආචාර්ය ගරු එම්.මුන්ඩාඩන් පියතුමන් මෙන් ම කේ.ජේ.ජෝන් නමැති වියත් ඉතිහාසඥයින් සොයා පළ කර තිබේ. මෙම දත්ත අතර මුල් කාලවල දී ශ්‍රී ලංකාවට වෙළඳම සහ රැකියාවන් සඳහා පැමිණි දකුණු ඉන්දියානුවන් විසින් කිතු දහම මෙහි හඳුන්වා දෙන ලදැයි සඳහන් වේ.

දකුණු ඉන්දියාවේ ජනතාව කිතු දහම වැළඳ ගෙන ඇත්තේ කිතු සමිඳුන් ගේම ගෝලයකු වූ ශු. තෝමස් මුනිඳුන්ගෙන් ය. මෙම ආරම්භයෙන් ඉක්බිති අප රටේ මාන්තෙයි (මන්නාරම) සහ ගෝකන්න (ත්‍රිකුණාමලය) යන පළාත්වල ද කිතු දහම ක්‍රමයෙන් ව්‍යාප්ත වී සීගිරිය දක්වා පැතිර ගිය බව සඳහන් වන්නේ ය,

(ලක්දිව කිතුනු පුරාණය - රීටා වෙල්ගම්පල - 7 පිටුව)

''තෝමපීඩියා'' නමැති ඉතිහාස ග්‍රන්ථය ලියූ ජෝර්ජ් මෙනච්චේරි සඳහන් කර ඇත්තේ තෙවැනි සත වසර වන විට කිතු දහම පෙරදිග පළාත්හි පැතිර ගොස් තිබුණ බව යි. ගොඩ බිම් මාවත් දිගේ මැද පෙරදිග සිට ඉන්දියාවටත් ලංකාවටත් කිතු දහම පැතිර ගිය බව හෙතෙම සඳහන් කරයි.

තිබුණු බව මෙහි සඳහන් වන්නේ ය.

ක්‍රි.ව. 550 දී පමණ අනුරාධපුරයට පැමිණි සංචාරකයකු වූ කොස්මස් ඉන්ඩොක්ලෙප්ටයුස්ටස් ''ටිපොග්‍රෆියා ක්‍රිස්ටියානා'' නමින් ලියූ ගමන් විස්තරයේ මෙහි සිටි කිතුනුවන් ගැන පැහැදිලිව සඳහන් කරයි. තමා එහි දුටු දෙව් මැදුර ගැන මෙන්ම පූජක තුමා ඇතුළු පිරිසක් ගැන ද හෙතෙම විස්තර කර ඇත.

අසල තිබී හමු වූ බව පෘතුගීසීන් ම සඳහන් කර ඇත. (ක්වේරොස් ඉතිහාසඥයා) එසේ ම වවුනියාවේ කෞතුකාගාරයේ තබා ඇති පැරණි ප්‍රසාද ස්නාපන ජල බඳුනකි.

# පෘතුගීසීනට පෙර සිටි කිතුනුවෝ



**අනුරාධපුර තිබී හමුවූ කුරුස ලාංඡනය දිවයිනේ තිබී හමුවී ඇති පැරැණිම කිතුනු පුරා වස්තුව යි. මෙය ශු. තෝමස් මුනිවරයාණන් අතින් කරන ලද කුරුස සැලැසුමක අනුකරණයක් බවත් එය එතුමන් මරණයට පත් කරන ලද දකුණු ඉන්දියාවේ මයිලපූර්හි "ලේ ගැලු කුරුසියට " ඉතා සමාන බවත් වාර්තා වන්නේ ය.**

ලංකාවේ දේශීය ජනතාව අතර කිතු දහම පැතිර ගිය බව ද සඳහන් කරන ඉතිහාසඥයෝ වෙති. මේ වැන්නන් බොහෝ දෙනෙකු සිටින අතර ජේ.කෝර්ඩිනර් සහ ජේ. හියු විශේෂයෙන් සඳහන් කළ හැකිය.

( A Description of Ceylon - University of Ceylon, Review of Christianity in India - Vol 111, BK iv pg 74)

පෘතුගීසීන් මෙහි පැමිණීමට පෙර කිතු දහම පැතිර ගොස්

ක්‍රි.ව. 479 සිට 497 දක්වා වූ සීගිරි යුගයේ දී එහි කිතුනු පිරිස් වාසය කළ බව මහාචාර්ය සෙනරත් පරණ විතාන වියතාණෝ සඳහන් කැර තිබේ. එතුමන් අනාවරණය කරති කරුණුවලට අමතරව තව තවත් කරුණු රැසක් මැත කාලයේ දී අනාවරණය වෙමින් පවතින්නේ ය.

මේ සියල්ලට අමතරව ක්‍රි.ව. 1912 දී අනුරාධපුර තිබී සොයා ගන්නා ලද කුරුසිය කදිම සාධකයකි. මෙවැනි ම තවත් කුරුසියක් කැළණි මෝය කටේ හෙවත් කැළණි ගඟ මුවදෙර

අනුරාධපුර තිබී හමුවූ කුරුස ලාංඡනය දිවයිනේ තිබී හමුවී ඇති පැරැණිම කිතුනු පුරා වස්තුව යි. මෙය ශු. තෝමස් මුනිවරයාණන් අතින් කරන ලද කුරුස සැලැසුමක අනුකරණයක් බවත් එය එතුමන් මරණයට පත් කරන ලද දකුණු ඉන්දියාවේ මයිලපූර්හි ''ලේ ගැලු කුරුසියට '' ඉතා සමාන බවත් වාර්තා වන්නේ ය.

ක්‍රි.ව. 2000 දී අනුමත කරන ලද ශ්‍රී ලංකා කතෝලික ධජයට නිල් පැහැයෙන් යොදා ඇත්තේ මෙහි ලාංඡනය යි.



**සුදුවර චරිතයක්**

**හඳුනාගනිමු**

# ශු. ජෙරොම්තුමා

**බොහෝ ශුද්ධවන්තයන් අප සිහිකරනුයේ ඔවුන්ගේ කැපී පෙනෙන ධර්මගුණයක් හෝ භක්තියක් නිසාය. නමුත්, ජෙරොම් තුමා අපට මතක් වනුයේ ඔවුන්ගේ තද කෝපාග්නිය නිසාය. සැබවින් ඔහුට තද කෝපාග්නි ස්වභාව හිමිවිය. ඔහුගේ පෑනෙන් ද ඔහු වරද කරුවාට තද පහර ගැසීය. එහෙත් ඔහු දෙවියන් වහන්සේට ද, දේව පුත්‍රවූ ජේසුතුමා වෙත ද, ගැඹුරුප්‍රේමයකින් දැල්විණි. වැරදි ඉගැන්වීම් කළ සැමදෙනා දෙවියන් වහන්සේගේ ද සත්‍යයේ ද සතුරා ලෙසින් සළකා ජෙරොම් තුමා ඔවුන් ලුහුබැඳ ගියේ ඔහුගේ බලවන්තවූත්, තීක්ෂණ ලෙස හද රිදවන පෑනෙන්ය.**



ජෙරොම් උපත ලැබුවේ ඩැල්මේෂියාවේය. ඔහු අධ්‍යාපනය ලදුයේ රෝමයේය. ඉන්පසු ඔහු තද පීඩාවකින් පෙළුනේද, ''ඇනීම'' ලබා ගන්නටය. ඔහු ප්‍රථමයෙන් දේව ශාස්ත්‍රය ඉගනීම සඳහා 'ට්‍රිවිස්'' නගරයට ප්‍රවිෂ්ට විය. මේ ස්ථානය ක්‍රිස්තු ධර්මය ඉගැන්වීම ද ඇමුණු බව වර්ධනය කර ගැනීමටද මධ්‍යස්ථානයක් විය. නමුත් අප ස්වාමීන් වහන්සේ ඔහුට අවබෝධ කළ සේක් ඔහු කිතුනුවකුට වඩා ග්‍රීකයකු වී සිටින බවය. එබැවින් ඔහු වසර 5 කට කාන්තාරයට පිවිස යාච්ඤා කරමින් ද, තපස් ක්‍රියා කරමින්ද, හෙබ්‍රෙව් බස ඉගෙනීමෙන්ද කාලය ගත කළේය.

ක්‍රි.ව. 380 දී ඔහු පූජාප්‍රසාදිතුමකු විය. පසුව ඔහු රෝමයට ගොස් වසර 5 ක් තුළ ශුද්ධෝත්තම පියතුමාගේ ලේකම් ධුරයට පත්ව සිටියේය. ජෙරොම්ගේ උතුම් කෘත්‍ය නම් ශු. බයිබලය පරිවර්තනය කිරීමයි. ඒ පරිවර්තනය වූ ''පොදු අනුවාදය'' නමින් හැඳින්වෙන ශු. බයිබලය බිහිවුයේ ජෙරොම් තුමාගේ නොමඳ උත්සහය නිසාය. එයට ජෙරොම් බයිබලය යයිද නම් කෙරේ.

එම මහගු ගාම්භීර කෘත්‍යය අවසන් කරන ලද්දේ ක්‍රි.ව. 404 දීය. වසර 18 ක් වෙහෙස දැරීමෙන් පසු පුරාණ ගිවිසුම හෙබ්‍රෙව් භාෂාවෙන්ද, නව ගිවිසුම ග්‍රීක් භාෂාවෙන් ද ගෙන පරිවර්තනය කළේය. තවද ඔහු බයිබලය විවරණයක්ද ලියුවේය. එතුමා ලියූ බයිබලය ලතින් ''වල්ගේත් '' ලෙස හැඳින්වේ. ඔහු පලස්තීන දේශයේ සැම තැනම සංචාරය කරමින් ක්‍රිස්තු ජීවිතයේ විශේෂ සිද්ධීන් සිදුවූ ස්ථාන ඔහුගේ භක්තිය උතුරා යාමට සැලැස්වීමෙන් එය සලකුණු කරන ලදී. වැල්සිස් කාන්තාරයේ වසර 5 ක් ගතකළේ යාච්ඤාව, පශ්චාත් තාපී ක්‍රියා සහ ඉගැන්වීමේ කටයුතු කිරීමටය. අන්තිමේදී ඔහු බෙත්ලෙහෙම් නගරයට ගියේය. එහිදී ඔහු ජීවත් වුයේ එදා ජේසු තුමා ඉපදුන ගවලෙන තුළය. ජීවිතාන්තය දක්වාම ඔහු තම ශරීරයට තදබල දඬුවම් පමුණුවාගත්තේ එක්වරුශීලය රැකීමෙන් හා රාත්‍රී වන්දනාව කිරීමෙන්ය.

ක්‍රි.ව. 420 සැප්තැම්බර් 30 වන දින බෙත්ලෙහෙම් නුවර දී ජෙරොම් තුමා මියගියේය. ඔහුගේ ශරීරය රෝමයේ ශු. මරියතුමීගේ මහා බැසිලිකා දෙව්මැදුරේ තැන්පත් කර ඇත.

ජෙරොම්තුමා එඩිතරව හා විවෘතව කථාකළ පුද්ගලයෙකි. ඔහු ඉක්මනින් කිපුණ නමුත්, ඊට වඩා ඉක්මනින් පශ්චාත්තාපික විය. අනුන්ගේ වැරදි ගැන ක්‍රියා කිරීමට වඩා තමන්ගේ වැරදි ගැන තදින් ක්‍රියා කළේය.

එතුමාගේ මංගල්‍යය සැප්තැම්බර් 30 දින සිදුකරනු ලබයි.

**අසේල දසනායක**

**මාසික සිතිවිල්ල**



සේයා :- ටෝනි නිශාන්ත ප්‍රනාන්දු

**මාසික සිතිවිල්ල**

''සැප්තැම්බර් මාසය''

ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**මාසික සිතිවිල්ල ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**

# නායකකන්ද මීසමේ දහම් ළමුන්ට ලේඛකත්ව හා ජනසංනිවේදන වැඩමුළුවක්



★ ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමන් පොල්තෙල් පහන දල්වන අයුරු පසකින් සිටිනුයේ ජෝශප් පයස් මහතාය.

**නායකකන්ද මීසමේ දහම් දරුවන් සඳහා ළමා ලේඛකත්ව හා ජන සංනිවේදන වැඩමුළුවක් පසුගියදා නායකකන්ද සා. මරියා දෙව් මැදුරු ශාලාවේදී පැවැත්වුණි.**

මේ සඳහා දහම් පාසලේ 09 ශ්‍රේණියේ සිට ඉහළ ළමෝ සහභාගී වූහ. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය හා ඥානාර්ථ ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. මෙහිදි එක්වූ ළමුන් හට ජනසන්නිවේදනය , පුවත්පත් කලාව හා නිර්මාණකරනය පිළිබඳව දැනුවත් කළ අතර වැඩමුළුව අවසානයේදී ලේඛක අභ්‍යාසයක්ද ලබා දුනි. මෙහි සාර්ථක නිර්මාණ ළමා ප්‍රදීපයෙහි පළකිරීමට කටයුතු යෙදීම ළමුන්ට ලැබුණු සුවිශේෂී වු අවස්ථාවකි. නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමාගේ අනුශාසකත්වයෙන් දහම් පාසලේ පන්හිඳ පර්ෂදයේ සහයෝගයෙන් ජෝශප් පයස් මහතා විසින් මෙය සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුව සඳහා ළමුන් 300 ක් පමණ සහභාගී වූහ.

**සේයා, සටහන -**
**නිමල් පෙරේරා,**
**ජුලියන් ගුණවර්ධන**



★ දේශක කුමර නයනජිත් මහතා විසින් පුවත් පත් කලාව පිළිබඳව ළමුන්ව ප්‍රායෝගිකව දැනුවත් කරනා අයුරු





★ නායකකන්ද මීසමේ වැඩමුළුවට එක්වූ දහම් පාසල් සිසු සිසුවියන්ගෙන් කොටසක්

# කුරුණෑගල පදවියේ ළමා ලේඛක වැඩමුළුවක්

## බුළුපිටිය මීසම

බුළුපිටිය මීසමේ දහම් පාසල් දු පුතුන්ගේ ලේඛක කුසලතාවයන් ඔප්නැංවීමේ අරමුණින් ළමා ලේඛක වැඩමුළුවක් 2012 ඔක්තෝම්බර් මස 07 වන ඉරුදින බුළුපිටිය ශු. කාර්මේල් මාතා දෙව්මැදුරේදී පැවැත්වේ. මෙය මෙහෙය වනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. බුළුපිටිය මීසම් සේවක ගරු ආනන්ද වීරකොන් පියතුමාගේ අනුශාසකත්වයෙන් මෙය සංවිධානය කෙරේ.



# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## සිව්වන තේමාව - ක්‍රිස්තියානි යාච්ඤාව



★ **යාච්ඤාව යනු කුමක්ද ?**

- යාච්ඤාව යනු සිත හා හදවත දෙවියන් වහන්සේ වෙත එසවීමකි.
- යාච්ඤාව යනු යහපත් දේ දෙවි පියාණන් වහන්සේගෙන් ඉල්ලීමකි.
- යාච්ඤාව යනු දෙවියන් සහ මිනිසා අතර ඇතිවන සංවාදයකි.
- දෙවි සමිඳුන් අදහන ක්‍රිස්තු භක්තිකයාගේ කිතුනු ඇදහිල්ලේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ යාච්ඤා කිරීමයි.
- දෙවියන් වහන්සේට නිරතුරු වන්දනා ස්තුති ප්‍රශංසා කිරීමත්, අපට අවශ්‍ය දේ ඉල්ලා ගැනීමත් උන්වහන්සේ වෙත සිත යොමු කිරීමත් යාච්ඤාව වේ.
- ලොව මවා වදාළ සර්ව බලධාරී දෙවියන් වහන්සේ කෙරෙහි ගැඹුරු විශ්වාසයක් තබන ඔබත් මමත් ඒ තැනැන් වහන්සේගේ සර්ව සාධාරණ ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් කරන උපහාරයයි.

★ **යාච්ඤාව නමැති සංවාදය කවුරුන් අතර සිදුවන්නක්ද ?**

- ස්ථිර දෙයක් මත සිටින දෙපාර්ශවයක් අතර සිදුවන්නකි. එනම් දෙවියන් වහන්සේ (මැවුම්කරු) හා මනුෂ්‍යයා (මැවිල්ල) අතර ඇතිවන්නකි.

★ **යාච්ඤාව නමැති සංවාදය කුමක් මත පදනම් වී ගොඩ නැගුණක් ද?**

- ගැඹුරු විශ්වාසය මත

★ **යාච්ඤාවේදී කුමන ආකාර ඒකාග්‍රතාවයකින් යුක්ත විය යුතුද?**

- ශාරීරික ඒකාග්‍රතාවයකින් යුක්ත විය යුතුය
- මානසික ඒකාග්‍රතාවයකින් යුක්ත විය යුතුය
- සමාජීය ඒකාග්‍රතාවයකින් යුක්ත විය යුතුය

**ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

★ **ශුද්ධවූ සභාවේ යාච්ඤාවේ ප්‍රභේද තුන නම් කරන්න.**

- වාචික
- භාවනා
- ධ්‍යානයට සමා වැදීම

★ **යාච්ඤාවේ අරමුණු කවරේද?**

- ස්වාමින් වහන්සේගේ මහිමය වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන් ද ප්‍රකාශ කිරීම
- අපගේ සහෝදරයන්ගේ ආත්මික හා ශරීරික අවශ්‍යතා තුළ ලෝකය ඒකරාශි කිරීම
- දෙවියන් වහන්සේගේ මහිමය සඳහා ක්‍රිස්තුන් වහන්සේ තුළ ලෝකය ඒකරාශි කිරීම
- අපගේම ආත්මික හා ශාරීරික අවශ්‍යතා දෙවිඳුන් වෙත ඉදිරිපත් කිරීම
- දෙවියන් වහන්සේ වෙත අපගේ ගැඹුරු භක්ත්‍යාදරය ප්‍රකාශ කිරීම
- සමිඳු ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දැක්වීම

★ **යාච්ඤාව උගන්වන පළමු පාසල කුමක්ද?**

- කිතුනු පවුල හෙවත් නිවස

★ **නිතර භාවිත වන පොදු යාච්ඤා නම් කරන්න.**

- සාන්ත කුරුසිය
- ත්‍රිත්ව ස්තෝත්‍රය
- ස්වාමිවාක් ආරාධනාව
- නමෝ මරිය (දේව දූත මංගලම්)
- උදය ආරාධනාව
- දයාධික මනස්ථාපනය
- භෝජන ආශිර්වාදය
- භෝජන ස්තෝත්‍රය
- රැකවල් දේව දූතයාට යාච්ඤාව
- රාත්‍රි ආරාධනාව

## කුරුණෑගල පදවිය



හිරිපොකුණ සා. හේලේනා දහම් පාසලේ ළමුන් 18 දෙනෙකු පසුගියදා පළමු වරට දිව බොදුන් ලැබිය දේව මෙහෙයෙන් පසු මීසම් සේවක ගරු කුවින්ටින් පෙරේරා මීසම් සහයක ගරු තරංග දිලෙක්ෂිත යන පියතුමන්ලා, ගරු රීටා මේරියන් පැවදි සොයුරිය සමග ළමුන් සමූහ සේයාරුවකට මුහුණ දුන් අයුරු.

## මහනුවර පදවිය

නාවලපිටිය ශාන්ත මරියා දේවස්ථානයට අයත් දරු දැරියෝ 32 ක් පසුගියදා නාවල පිටිය මීසම් සේවක ගරු නිව්මන් පීරිස් පියතුමන් අතින් ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගත්හ.




ගරු පියතුමා, ගරු පැවදි සොයුරියන් සහ දූ දරුවන් ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට මුහුණු දුන් අයුරු. **ජුඩ් ජේ. ප්‍රනාන්දු**



## රත්නපුර පදවිය



මාහේන ක්‍රිස්තු රජාණන්ගේ දහම් පාසලේ දරු දැරියෝ 19 දෙනෙක් පසුගියදා පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. දේව මෙහෙය මීසම් සේවක ගරු බැස්ටියන් පිල්ලේ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. ගරු පියතුමා, දරු දැරියන් පුහුණු කළ දහම් පාසලේ ගුරු භවතුන් හා ළමුන් සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. ක්‍රිස්ටෝපර් වික්‍රමසිංහ

## කොළඹ අගරදගුරු පදවිය

කොටරුපේ ශුද්ධවූ ලුවිස් මුනි දෙව්මැදුරට අනුබද්ධ දහම් පාසලේ ළමෝ පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද ලබා ගත්හ. රද්දොලුගම මීසම් සේවක ගරු ප්‍රසාද් පෙරේරා පියතුමන් සහ දහම් ගුරු මහත්මිය සමග ළමුන් ඡායාරූපයකට එක්වූ අයුරු. **රන්ජිත් ලොකුපෝතාගම**



දහම් පාසල් හා පාසල් වල දිව බොදුන් ලැබීම් හා සුදතුම් වරම් ලැබීම් වල ඔබ එවන සේයාරු පැහැදිලි විය යුතු අතර සමූහ සේයාරුවක් පමණක් අපට එවන්න. එසේම දිව බොදුන්, සුදතුම් වරම් ලැබූ ළමුන් සංඛ්‍යාවද සඳහන් කර එවන්න. ළමා ප්‍රදීපයේ පළ කිරීමට ඔබ එවන සේයා රු පළ කිරීමේදී අප විසින් මෙහි සඳහන් කරුණු පිළිබඳව වඩාත් සැලකිලිමත් වන බව කරුණාවෙන් සළකන්න.

සංස්කාරක පියතුමා

**ඔක්තෝබර් මාසය ජපමාල මාසය ලෙසයි නම් කර තිබෙන්නේ. මේ ජපමාල මාසයේදී දේවමාතාවන් පසසන ජපමාලය උච්චාරණය කිරීම විශේෂ ජනවන්දනා පිළිවෙතක් ලෙස සිදු කෙරෙනවා. මෙවර කිතුනු උරුමයෙන් ජපමාලයේ මහත් අගය සහ වටිනාකම ඔලිම්පික් පදක්කමකට වඩා වටිනා බව ලෝකයට ඇසෙන්නට හඬගා කී මලල ක්‍රීඩිකාවක් ගැන කියා දෙන්නටයි මං මේ වෑයම් කරන්නේ.**



# ලෝකඩ
# ජපමා
# ලොවට හ

**"මොන තරම් පදක්කම් තෑගි - සම්මාන ලැබුණත් මට ඒ සියල්ලටම වඩා වටින්නේ මෙන්න මේ මගේ ජපමාලයයි" ඇය වාර්තාකරුවන්ට තමන් සුරැකිව ළඟ තබාගෙන සිටින ජපමාලය පෙන්නද්දී වාර්තාකරුවෝ විමතියට පත්වුහ.**

එංගලන්තයේ පැවති පැරාලිම්පික් හෙවත් ආබාධිතයන්ගේ ක්‍රීඩා තරගාවලියේදී තමයි මේ සිද්ධිය සිදු වුණේ. එහිදී මීටර් 1500 ධාවන තරගයෙන් ලෝකඩ පදක්කම දිනා ගත්තේ ඉතාලි ජාතික අන්ධ ක්‍රීඩිකාවක්. ඇසින් අන්ධ වුවත් මේ ක්‍රීඩිකාව විශ්වාසයෙන් ඉතාමත් ශක්තිමත් . ඇගේ නම අන්නාලිසා මිනෙට්ටියි. සිය පැරාලිම්පික් ජයග්‍රහණයෙන් අනතුරුව වාර්තාකරුවන් ඇය වටා රොක්වූයේ මේ පැරාලිම්පික් ලෝකඩ පදක්කමේ මහිමය පිළිබඳව ඇය දක්වන අදහස් දැන ගැනීමටයි. වාර්තාකරුවන් පමණක් නොව මුළු ලෝකයම මවිතයට පත්කරමින් අන්නාලිසා මිනෙට්ටි මෙසේ ප්‍රකාශ කළාය.




අද දක්වාම මගේ එකම රැකවරණය සහ ආරක්ෂක පදක්කම වූයේ මෙයයි. මෙය හැමදම මගේ ළඟ හිඳිමින් මගේ ආරක්ෂාව හා රැකවරණය සලසමින් මට තනි රැක්කා යැයි අන්ධ ක්‍රීඩිකාව ඉතාමත් හැඟීම්බරව ප්‍රකාශ කරද්දී වාර්තාකරුවන්ගේ දෙනෙතටද කඳුළු බිඳු නොනැගුනා නොවේ.

වර්ෂ 1976 දෙසැම්බර් 27 වැනිදා ඉතාලියේ මිලාන් නුවරට ආසන්න රෝ නගරයේ දී ඇය උපත ලැබුවාය. කුඩා කාලයේ පටන් නැටුමට හා ගැයුමට එකසේ දස්කම් පළ කළ ඇය අවුරුදු පහලොවේදී ගායිකාවක් ලෙස කළඑළි බැස්සාය. එහෙත් ඇයට යන්තම් අවුරුදු 20 පිරෙද්දී ඇගේ ඇසේ මතු වූ

# පැරාලිම්පික් ඩ පදක්කමට වඩා ළය වටිනා බව ඬගෑ අන්ධ ක්‍රීඩිකාව



මාරාන්තික රෝගී තත්ත්වයක් වෛද්‍යවරුන් විසින් වෛද්‍ය පරීක්ෂණ වලින් සොයා ගන්නා ලදී. අවාසනාවකට මෙන් ඉන් ඇගේ ඇස් දෙකම පෙනීම නැතිව ගොස් හිරිමල් යෞවන වියේදී අන්ධ බව තුරුළු කර ගැනීමට ඇයට සිදුවිය.

මේ පිළිබඳව කරුණු දක්වමින් ඇය මෙසේ පවසන්නීය. ‘‘ඔබට විශ්වාසයක් තිබේ නම් ඔබේ කවර හෝ දුක් වේදනා ජය ගැනීමට තරම් ශක්තියක් ඒ විශ්වාසයෙන් ලබාගත හැකියි. සමහර දුක් වේදනා වලට නමක් නොමැති ඒවා ඔබට විස්තර කිරීමටවත් , සාධාරණය කිරීමටවත් නොහැකි තත්ත්වයක් පවතී. එහෙත් ඔබට දෙවියන් වහන්සේ කෙරේ ඉතාමත් තදබල විශ්වාසයක් පවතී නම් ඔබ එවැනි දු :ඛවේදනා වලදී මගෙන් හෝ වෙනත් කෙනකුගෙන් ආධාර උපකාර බලාපොරොත්තුවෙන් යැපෙන්නට සිදුවන්නේ නැහැ. එය සැබැවින්ම සුවිශේෂී අත්දැකීමක්.

අන්නාලිසා මිනෙට්ටි විවාහ වී සිටින අතර ඇය එක් දරු මවකි. ඉතාලියේ ඇය ප්‍රකටව සිටින්නේ ආබාධිත ක්‍රීකාවකට වඩා ඉතා ජනප්‍රිය ගායිකාවක වශයෙනි.



වර්ෂ 1998 දී අන්නාලිසා මිනෙට්ටි සුවිශේෂී සැන් රෙමෝ සංගීත සංදර්ශන මාලාවෙන් ජයග්‍රහණය ලැබුවාය. ජේසුස් වහන්සේ නිරන්තරයෙන් මා සමග සිටිමින් උන්වහන්සේගේ කැමැත්ත මා තුළින් ඉෂ්ට සිද්ධ කර ගන්නවා. මෙවර එංගලන්තයේ පැවැති පැරාලිම්පික් තරගාවලියේ මීටර් 1500 තරගයේදී වගේම මීට පෙර බොහෝ අවස්ථාවලදී මගේ ජයග්‍රහණ වලදී මා අත් දුටුවේ එයයි. මා වැනි දුබල වටිනාකමක් නැති කෙනකුව ප්‍රබල වටිනාකමක් ඇති ලෙස ඔසවා තබන්නේ උන්වහන්සේයි. ඒක මගේ ජීවිතයෙන් අත්දැක ඇති අදත් අත්දකින හෙටත් අත්දැකීමට බලාපොරොත්තු වන සුවිශේෂී අත්දැකීමයි. ඇය පවසන්නීය.

ශිරාන් මෛත්‍රී

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි. පාඩම් අංක : 71

## PREPOSITIONAL PHRASES
## (ප්‍රිපොසිෂනල් ෆ්‍රේසස්)

PHRASE PREPOSITIONS හෙවත් COMPOUND PREPOSITIONS ගැන ඉගෙන ගත්තා. මීළඟට අපි PREPOSITIONAL PHRASES(ප්‍රිපොසිෂනල් ෆ්‍රේසස්) ගැන ඉගෙන ගනිමු. මොකක්ද මේ PHRASE PREPOSITIONS කියන එකෙයි PREPOSITIONAL PHRASE කියන එකෙයි වෙනස?

PHRASE PREPOSITION හෙවත් COMPOUND PREPOSITION කියන එකේ වචන කීපයක් අඩංගු වුනාට ඒ සියල්ලම එක වචනයක අර්ථයකිනුයි භාවිතා කෙරෙන්නෙ. වචන කීපයක් වුනාට තනි වචනයකට ගැබ්වුණු, තනි වචනයක තේරුම ඇති තනි වචනයක බලය ඇති විදිහටයි ඒවා වාක්‍ය වල භාවිතා වෙන්නෙ.

නමුත් Prepositional Phrases ඊට ටිකක් වෙනස්. <u>PREPOSITIONAL PHERSES කියන්නෙ එක PREPOSITION එකක් අඩංගු වාක්‍ය ඛණ්ඩයකට.</u> සාමාන්‍යයෙන් Preposition එකකට පස්සෙ නාම පදයක බලය අඩංගු වචනයක් හෝ වචන එකතුවක් තමා Prepostional Phrase එකකදී දකින්න ලැබෙන්නෙ.

අපි නිදසුනක් බලමු.
I feel relaxed because of all these trees.
(අයි ෆීල් රිලැක්ස්ට් බිකෝස් ඔෆ් ඕල් දීස් ට්‍රීස්.)
මේ ගස් සියල්ල නිසා මම සැහැල්ලුවක් විඳිනවා.

බලන්න. මේ වැකියෙ **of all these trees** කියන කොටස Prepositioional Phrase එකක්. ඒකෙ of කියන්නෙ තනි වචනයෙ Preposition එකක්. all thes trees කියන වචන එකතුව එක වචනයක නාම පදයකට සමානයි.

එතකොට මේ of කියන Preposition එකට බඳුන් වන නාමපදය තමයි 'all this trees" කියන්න. ඉතින් ඒ <u>Preposition + Noun යන එකමුතුවට තමයි Prepositioional Phrase කියන්නෙ.</u>

තව නිදසුනක් බලමු.
They move about in groups ඔවුන් ගමන් ගන්නේ රංචු වශයෙන්. මෙතැන In කියන්නෙ Preposition එක.
groups කියන්නෙ තනි වචනයේ නාම පදයක්. මේ දෙකම එක්වුනාම අපි Prepositional Phrase එකක් කියලා හඳුන්වනවා. ඒ මුළු එකම වාක්‍ය ඛණ්ඩයක්. අපි ඉගෙන ගත් Phrase Prepositions නැවත හොඳින් බලන්න. ඒවා සමග මේ Prepositional Phrases සසඳා බලා වෙනස තේරුම් ගන්න.

**<u>Prepositional Phrases</u>** <u>වර්ග කීපයකට බෙදන්න පුළුවන්.</u>
කාලය ගැන (Time), විදිහ ගැන (Manner) ස්ථානය ගැන (Place) යනාදී වශයෙන් වාක්‍යක් තුල නොයෙක් විදිහේ අදහස් පිළිබිඹු වන Prepositional Phrases තියනවා.
අපි ඒවා දැන් හඳුනා ගනිමු.

### A) <u>PLACE ස්ථානයක් ගැන කියන Prepositional Phrase.</u>

01. Some rare trees are found **<u>in</u>** Sinharaja forest.
(සම් රෙයා (ර්) ට්‍රීස් ආ ෆවුන්ඩ් ඉන් සිංහරාජ ෆොරස්ට්.)
සමහර දුර්ලභ ගස් සිංහරාජ කැලයේ තියනවා.

02. They were holidaying **<u>in</u>** Australia.
(දේ ව(ර්) හොලිඩේයිං ඉන් ඔස්ට්‍රේලියා)
ඒගොල්ලො ඔස්ට්‍රේලියාවේ නිවාඩු ගතකලා.

03. They ran **<u>across</u>** the road.
(දේ රැන් එක්‍රොස් ද රෝඩ්)
ඒගොල්ලෝ පාර හරහා පැන්නා.

04. They were fighting **<u>in</u>** the boxing ring.
(දේ ව(ර්) ෆයිටිං ඉන් ද බොක්සිං රින්ග්)
ඒ ගොල්ලො බොක්සිං ගහන කොටුව ඇතුලෙ ගහ ගත්තා.

05. Kamani sat **<u>beside</u>** Kamala.
(කමනි සැට් බිසයිඩ් කමලා)
කමනි කමලා ලඟින් වාඩිවුනා.




# පරිත්‍යාගය



**ආදරණීය දුවේ පුතේ,**

මම කැමතියි මෙදා 'පරිත්‍යාගය' යන වචනය පිළිබඳව ඔබත් සමග අදහස් කීපයක් බෙදා ගන්න. ඔබත් මේ වන විට යම් යම් දේවල් ඔබ දන්නා අයට වගේම ඔබ නොදන්නා අයටත් පරිත්‍යාග කර ඇති.

සැබවින්ම පරිත්‍යාගය කියන්නේ මොකද්ද? අපි ළඟ තිබෙන වැඩිපුර යමක් තවත් කෙනෙකුට ලබා දීමක්ද? එසේත් නැතහොත් අපි ආහාරයට ගත් දෙයින් ඉතිරි වූ කොටස හෝ අපට යමක් පාවිච්චි කිරීමට නොහැකි වූ විට ඒ දේ තවත් කෙනෙකුට ලබා දීමක්ද? මෙබදු ක්‍රියාවකින් සැබවින්ම පලක් තිබේද මෙබඳු දේ දෙවිඳුන්ට ප්‍රසන්නද යන්න පිළිබඳව සිතා පැලිය යුතු වේ.

වැඩියෙන් තිබෙන දෙයක් ඉතිරි වූ දෙයක්, තවත් කෙනෙකුට ලබා දීම මගින් අපට කිසිම අඩුවක් හිඟ වීමක් පිළිබඳව දැනීමක් අප තුළ ඇති වන්නේ නැත. එසේ නම් සැබෑ පරිත්‍යාගය යනු අප සතු හොඳම දෙය සැබෑම අවශ්‍යතාවයක් ඇති කෙනා සඳහා ලබා දීමය.

ජේසුස් වහන්සේ නම් අපට කියන්නේ ඔබ යමක් දෙන විට වමතින් දෙන දෙය දකුණතට නොදැනෙන ලෙස ලබා දිය යුතුයි කියලා. එහෙත් අපි බොහෝ දෙනෙක් යම් යම් දේ පරිත්‍යාග කරන විට දැඩි කැමැත්තක් දක්වනවා අනිත් අයට පෙනෙන විදිහට, ප්‍රසිද්ධියෙ පරිත්‍යාග කරන්න.

ස්තුති ප්‍රශංසා කීර්තිය ලබා ගන්න. ඒත් ජේසු නම් මේ වගේ වැඩ වලට අකමැති වෙයි. මොකද ජේසුගේ වචන වලට මේ වගේ ක්‍රියාවන් විරුද්ධ වන නිසා. මා එක්තරා අධ්‍යාපන ආයතනයක සේවය කරන විට, එම ආයතනයේ මහත්මියක් විශාල පිරිසක් එකතු වී සිටින ස්ථානයකට පැමිණ, ඇදිය හැකි, එහෙත් පරණ දුර්වර්ණ ඇදුම් බෑගයක් සහ තම දරුවන් ඉවත දැමූ හුණු කූරු පෙට්ටි කිහිපයක් , තමා දිළිඳු දරුවන් වෙත පරිත්‍යාග කිරීමට සූදනම් බව දන්වා දිළිඳු දරුවන් සඳහා සේවය කරන තවත් මහත්මියක් වෙත ඒ සියල්ල බාර කළා.

එහෙත් මේ සියලු උපකරණ සහ ඇදුම් තම දරුවන් පාවිච්චි නොකරන ඉවත දැමූ ඒවාය. මෙබදු දේ ප්‍රසිද්ධියේ පරිත්‍යාග කිරීම තුළින් ලොකු සතුටක් ලැබුවත් ජේසුව නම් සතුටු කරන්න බැරිවේවි. එසේ නම් අපි පරිත්‍යාග කරන විට ජේසුව සතුටට පත්කළ හැකි ආකාරයෙන් පරිත්‍යාග කිරීමට උත්සහ කරමු.

ජී .ඒ නිමාලි ප්‍රනාන්දු
ගුරු මව

## සුදු පවුලේ සොයුරියෝ



තෙරක් නොපෙනෙන,
මහ සයුර මැදින් ගම් නියම්
ගම් සැරිසරා ගොඩ බැසුවේ,
සිරි ලක් දෙරණට
දෙවිඳුන්ගෙන් ලද කැඳවීම
අබියස සමිඳු මිදි උයනෙහි
රන් අස්වනු නෙලා දෙන්න,
තම දිවි කැපකර,
විඩාව තනිකම නොතකා
නොයෙකුත් ගම් බිම් පසු
කරමින් කිතු දහමින්
ලාංකිකයන් පෝෂණය කරමින්,
සුදු පවුලේ ආදර්ශයත්,
සහෝදරත්වයත් මැද
පාළුව තිබූ ලක් කිතුනු කෙතෙහි
රන්වන් කරල් අස්වද්දා
පුංචි තාරකා මෙන් ආලෝකය ගෙන දුන්
සුදු පවුලේ සොයුරියෝ සදා වැජඹේවා !

**සාරා නිපුනි පෙරේරා**
**10 ශ්‍රේණිය**
ශුද්ධවූ පවුලේ බාලිකා මහ විදුහල - වෙන්නප්පුව



**( රත්නපුර පදවිය )**

**චිත්ත මෝස්තරයක්**

**සංජුලා ඩැෆ්නි**

04 ශ්‍රේණිය

සා. ලාසරස් දහම් පාසල

උතුවන් කන්ද

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"

ළමා ප්‍රදීපය, අංක 02,

ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**(කොළඹ අගරදගුරු පදවිය)**

**දෙවිඳුන් යදින පවුලක්**

**ඒවාන් ප්‍රනාන්දු**

08 ශ්‍රේණිය

ලූර්දු මාතා දහම් පාසල,

කිඹුලාපිටිය



**(මහනුවර පදවිය)**

**ජුසේ වාස් පියතුමා**

**ක්‍රිෂානි වීරසිංහම්**

05 ශ්‍රේණිය, සාන්ත තෝමස් දේවස්ථානය

මාතලේ



**(කුරුණෑගල පදවිය)**

**සත්ව ලෝකයේ අසිරිය**

**රෙහාඩ් මේරියස් ජාන්ස**

10 ශ්‍රේණිය

සාන්ත සේවියර් දහම් පාසල

තල්ගහපිටිය



**(හලාවත පදවිය)**

**සොබාදහමේ සුන්දරත්වය**

**ටිරුණි ශලිනිකා**

09 ශ්‍රේණිය

ශු. පවුලේ දහම් පාසල

රාජකදළුව



**(බදුල්ල පදවිය)**

**අපේ ආදි මව්පියෝ**

**අෂනි දුල්සරා ගුණවර්ධණ**

07 ශ්‍රේණිය

ශු. පවුලේ දේවස්ථානය - බිබිල

# රාජකදළුව මීසමේ සුදතුම් වරම් ලැබීමට සූදානම් වන ළමුන් සඳහා පැවැත්වූ ලේඛක වැඩමුළුවේදී ලබා දුන් අභ්‍යාසයේ ජයග්‍රාහී නිර්මාණයන්

## සුදත් සුරිඳුනි



ස්ප්‍රිතු සාන්තු දෙවියනි,
ගිනිදැල්ලක් ලෙස
වඩින්න මා වෙතට
ඔබ වහන්සේ මා වෙතට
වැඩම කර මා ශුද්ධවූ
කතෝලික සභාව තුළ
පරිණත කිතුනුවෙක් බවට
පත් කළ මැනව ශුද්ධවූ
ත්‍රිත්වයේ තුන්වන
තැනැන්වහන්සේ වන ඔබ
මා වෙතට වැඩම කර මාගේ
ජීවිතයේ ඇති සියලුම අසුභවාදී සිතුවිලි දුරු කර
මා තුළ සුභවාදී සිතිවිලි ඇතිකර මා ඔබ වහන්සේගේ
සෙවණට කැඳවා ගනු මැනව
ජීවදායකයාණෙනි, ඔබගේ දෙව් දහම දෙසන්නට
මා සවිමත් කළ මැනව

**ජයනි ප්‍රසාදිකා**
09 ශ්‍රේණිය
ශු. ප්‍රැන්සිස් මුනි දහම් පාසල
ආනවිලුන්දව (රාජකදළුව මීසම)

## ජීවිතය



ගල් කුළු අතරින් ගලා බස්නා
නිල් වන් දිය දහරක් සේය ජීවිතේ
නිමක් නොපෙනෙන වැලි කතරක
සොයන්නෙමි මම ජීවිතේ
සොයාගත්තද නොසොයාගත් බොහෝ දේ
ඇති බව සොයාගත්තෙමි ජීවිතේ
කතරක අතරමං නොවී සඳුන් රුකක් යට
සෙවණ වන්නට පතන්නෙමි මුළු ජීවිතේ

**සංජනා දිල්හාරි**
09 ශ්‍රේණිය, සාන්ත ජූඩ් දහම් පාසල - මුතුපංතිය
(රාජකදළුව මීසම)

## උදෑසන අසිරිය



හිරු කුමරා කඳු මුදුනින් එබී බලනවා
ළහිරු මඬල පොළව දෙසට ගලාන එනවා
සිහිල් සුළං රැල් දැන් දැන් පාවී එනවා
ඒ සුළඟින් අප ගත සිත පිබිදී යනවා

මල් කැකුළුත් විකසිත වී සුවඳ හමනවා
මී මැස්සන් සමනලුන් ද පියඹා එනවා
කීචි බීචි ගා කුරුල්ලෝ ගීත ගයනවා
කුරුලු නදින් පරිසරය ම පිබිදී යනවා

**තරුෂිකා තත්සරනි**
08 ශ්‍රේණිය - ශු. පාවුලේ දහම් පාසල - රාජකදළුව



**ඉසුරු ධනංජන**
09 ශ්‍රේණිය
වික්ෂෝප දේව මාතා
දහම් පාසල - වෛරන්කට්ටුව
(රාජකදළුව මීසම)

## මව් සෙනෙහස

*නොහැකිමුත් ගලපන්න*
*ඔබේ සෙනෙහේ කවියකට*
*හැඳින්නෙමි මෑණියෙනි*
*මා ඔබගේ ලයෙහි*

*ගත රුහිරු කිරි කෙරුවා*
*ඔබේ නිමල ආදරය*
*පතන්නෙමි මෑණියෙනි*
*ලොව තුළින් දිනන්නට*

*ඔබයි මගේ ජීවේ*
*ආදර මගේ මෑණියෙනි*
*සදා ආදරෙයි මම*
*මගේ හද පතුලෙන්ම*

**දිව්‍යා ගයනි**
09 ශ්‍රේණිය ලුර්දු දහම් පාසල
පාන්කුලාව (රාජකදළුව මීසම)



**සචිනි කෞශල්‍යා**
09 ශ්‍රේණිය
ශු. පාවුලේ දහම් පාසල
රාජකදළුව

# ප්‍රහේලිකා අංක 33



සැකසුම

තිළිණි දුතිකා පෙරේරා

## හරහට

1. මෙම නම ඇති මාසයේදී දේව මෑණියන්ට මංගල්‍යයක් පවත්වනු ලැබේ.

2. මරියා සොහොන් ගෙය තුළට නැමී බැලූ විට ක්‍රිස්තුන් වහන්සේගේ සිරුර තබා තිබුණ තැන , දේවදූතයන් දෙදෙනෙකු එක් තැනැත්තෙක් ......... තිබු තැනද, අනික් තැනැත්තා පාද අද්දරද හිඳුනු දුටුවාය. මෙහි හිස්තැනට සුදුසු වචනයට සමාන වචනයකි.

4. ක්‍රිස්තුන් වහන්සේ තම ප්‍රථම ශ්‍රාවකයන් කැඳවූයේ ගෙනසෙරෙත් ....................... අසලදීය. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ගාබ්‍රියෙල් දේව දූතයා මරියතුමීට කතා කොට ''......................... ප්‍රසාද ලත් උත්තමාවිය , ඔබට මංගලම් වේ'' යැයි ප්‍රකාශ කළේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. ක්‍රිස්තුන් වහන්සේ ධර්ම ශාලාවේදී යෙසායා දිවැසිවරයාගේ ග්‍රන්ථය කියවා ''අද ඔබ සවන් දී සිටියදීම මේ ශුද්ධ ..............පාඨය ඉෂ්ට වී යයි'' වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. තමා ............... සතුටු කරන තැනැත්තේ සමිඳුන්ට කීකරුවන්නේ යැයි උපදේශකයා පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

9. දෙවියන්වහන්සේ විසින් මෝසෙස්තුමාට දෙන ලද පනත් සංඛ්‍යාව

## පහළට

1. ඊශ්‍රායෙල් ජනයා මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධව පාළු කරයේදී .................. කියන්නට වූහ. හිස්තැනට සුදුසු වචනය

2. දෙවියන් වහන්සේ මෙසේ වදාරණ සේක. ''අහස පොළොවට වඩා බොහෝ ඉහළින් ඇතිසේ නුඹේ සිතුවිලි වලට වඩා මාගේ ................. බොහෝසේ උසස්ය. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ''යහපත් බිරිඳකගේ වැඩකටයුතු වල ........ වර්ණනා කරන්න.'' යනුවෙන් හිතෝපදේශ පොතේ සඳහන් වෙයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ක්‍රිස්තුන් වහන්සේ පාවා දෙන්නේ කවරෙක්දැයි උන්වහන්සේගෙන් ප්‍රශ්න කළේ උන්වහන්සේගේ ........................ ළංව හාන්සී වී සිටි ගෝලයාය මෙහි හිස්තැනට සුදුසු වචනය

8. දෙවියන් වහන්සේ ...... නරපතීන් සිය සිහසුන් වලින් පහත හෙළා දීනයන් උසස් කළ බව මරිය තුමියගේ උදන ගීයේ සඳහන් වේ හිස්තැනට සුදුසු වචනය

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ජුවාම් 20/13, ශු. ලූක් 1/ 28 ,යෙසායා 55, ශු. ලූක් 1/ 52 , 4 / 21 , 5 හිතෝපදේශ 31/31, උපදේශකයා හෙවත් සිරාක් 3, නික්මයාම 16/2)

## රත්නපුර පූජා උදව් ළමුන්ට දේව කැඳවීම ගැන කඳවුරක්



පසුගියදා රත්නපුර මීසමේ පූජාවට උදව් වන ළමුන් සඳහා දෙදින දේව කැඳවීම් කඳවුරක් තන්ජන්තැන්න සාන්ත මරියා සිද්ධස්ථාන පරිශ්‍රයේ රැස්වීම් ශාලාවේදී පැවැත්වින. කඳවුර අවසානයේ රත්නපුර මීසම් පාලක ගරු රන්ජන්මාල් මොරායස් , තන්ජන්තැන්න සිද්ධස්ථනයේ සහයක ගරු ප්‍රියන්ත ප්‍රනාන්දු යන පියතුමන්ලා, රත්නපුර සෙඩෙක් පරිපාලක නිලධාරී සුනිල් ප්‍රනාන්දු මහතා සහ මෙයට එක්වූ ළමුන් සේයා රුවකට පෙනී සිටි අයුරු **තියබෝල්ඩ් සමරතුංග**

## ප්‍රහේලිකාව පුරවා එවීමේදී

- ප්‍රහේලිකා පුරවා එවීමේදි ඔබගේ නම, ලිපිනය, පාසල, දහම් පාසල, ඉගෙනුම ලබන ශ්‍රේණිය හා දුරකතන අංකයද පැහැදිලිව ලියා අප වෙත යොමු කරන්න.
- එක් අයෙකුට ප්‍රහේලිකා පුරවා එවිය හැක්කේ 2 ක් පමණක් බැව් කරුණාවෙන් සලකන්න.
- ඔබ පුරවා එවන ප්‍රහේලිකාව තැපැල් පතක අලවා එවීමද **අනිවාර්ය** බැව් සලකන්න.

**සංස්කාරක පියතුමා**


රජ කුමාරයයි කිඳුරු කුමාරියයි
කතාව:- එ.එ. ආනන්ද කල්දේරා
දෙබස්, චිත්‍ර:- ඇස්.ඒ.පී. සපුආරච්චි
17
කිඳුරු රාජධානියේ රැජිණට පෙරදින රාත්‍රියේ කුමාරිගේ අතුරුදන්වීම ආරංචි වුනා..
මහ රැජිණියනි.. කුමාරී.. ඊයෙ රාත්‍රියේ මාළිගාවේ සිටියේ නැහැ....
ඩලාගෙන යනකොට මන්තර කාරිගෙ දුවත් ඉඳල නැහැ...
මන්ත්‍රකාරිගෙ දුවත් එක්කයි.. ..ගිහිං.... තියෙන්නෙ
මේ දෙන්න ඊයෙ රෑ කොහෙද ගියෙ? වහාම මන්ත්‍රකාරියට මේ ගැන කියන්න ඕනි..!
හොඳටම කේන්ති ගිය රැජිණ මන්ත්‍රකාරිට මේ විස්තරේ කිව්වා..
ඔයගෙ කුමාරියි ඔයාගෙ දුවයි. ඊයෙ රාත්‍රියෙ විමානයෙන් පිට කොහේදෝ ගිහින්
මේ ගැන හොයන්න මන්ත්‍රකාරියට රැජිණ දැනුම් දුන්නා..! එයා මායා කැඩපත ළඟට ගිහිනි වෙච්ච දේවල් සේරම මායා කැඩපතෙන් බලාගත්තා...
माया दरपन..
माया दरपन... क्या बात.. है
क्या बात..है... देखो.. देखो....
ඔහ්.. මුහුදු දෙවියනේ කිඳුරු කුමාරි.. මගෙ දුවගෙ උදව් අරගෙන කුමාරයව බේරගෙන.. මම දැන් මොකද කරන්නේ..

සැකසුම : තිළිණ අලහකෝන්

# නිවාඩුව





ඔන්න පහුවදා උදෙන්ම චන්ඩි ආච්චියි අක්කයි එක්ක පල්ලියට ගියා... වෙනදා වගේ අකමැත්තෙන් නෙවෙයි.. බොහෝම කැමැත්තෙන්...

එදා ඉඳලා චන්ඩි අක්කත් එක්ක දහම් පාසල් ගියෙත් බොහෝම කැමැත්තෙන්...



කාටත් කරදරයක් වෙලා දඟවැඩ කරමින් හිටපු චන්ඩි, ඉන් පස්සෙ බොහෝම හොඳ දරුවෙක් බවට පත් වුනා... චන්ඩි ස්වාමි කෙනෙක් වෙන්න පුංචි සෙමනේරියට ඇතුළු වුණා. පසුව බොහෝම භක්තිවන්ත පියතුමෙක් වුන චන්ඩි, කවුරුත් ආදරය කරන හැමෝගෙම ගෞරවය දිනාගත්ත පියතුමකු බවට පත් වුණා. බොහෝම මහළු වෙන තුරුම අසරණ අහිංසක මිනිසුන් වෙනුවෙන් තමන්ගේ ජීවිතයයි තමන් සතු සියල්ලයි කැප කළ ඔහු පසුව ස්වර්ගස්ථ වුනා. අදත් මේ භක්තිවන්ත දැහැමි පියතුමා ගැන කවුරුත් කතා බහ කරනවා.



අවසානයි